Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා උඩරට දුම්රිය මාර්ගයේ ඇති වැදගත්කම පිළිබඳ ශදුඅත (SWOT) විමර්ශනයක්

*ඩබ්.එස්.අයි.එස්.ගුණසේකර* [1]
*ඒ.ඒ.ඩී. අමරසේකර* [2]

සංක්ෂේපය

ලෝකයේ ශීඝ්‍රයෙන් වර්ධනය වන කර්මාන්ත අතර සංචාරක කර්මාන්තයට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. ශ්‍රී ලංකාවේ ආදායම් උපයන කර්මාන්ත අතර සිව්වන ස්ථානය හිමි කර ගනී. සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා බලපාන ලද ප්‍රබල සාධකයක් ලෙස ආර්ථික ක්‍රියාවලියේ දී යටිතල පහසුකම් ගණයෙහිලා සැලකෙන ප්‍රවාහන මාධ්‍යයේ ශීඝ්‍ර දියුණුව දැක්විය හැක. මෙහිදී ගොඩබිම් ප්‍රවාහන මාධ්‍යක් ලෙස දුම්රිය සේවාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. අද වන විට ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග දෙස් විදෙස් සංචාරකයන් තම සංචාරය සඳහා බහුල ලෙස තෝරා ගැනීමේ ප්‍රවණතාවක් පවතී.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා ප්‍රධාන දුම්රිය මාර්ගය වන උඩරට දුම්රිය මාර්ගය කුමන දායකත්වයක් සපයන්නේ ද යන්න විමර්ශනය කිරිම මෙහිදී සිදු වේ. විශේෂයෙන් විදේශීය සංචාරකයන් උඩරට දුම්රිය මාර්ගය ඔස්සේ සංචාරය සිදු කරන ලද බැවින් ඔවුන් අපේක්ෂා කරන ලද පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා දුම්රිය සේවය සමත් වී තිබේද යන්න ගැටලුවකි. එහිදී ශක්තීන් , දුර්වලතා, අවස්ථා, තර්ජන හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මේ අනුව ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යටතේ සම්මුඛ සාකච්ඡා , ප්‍රශ්නාවලී මගින් ප්‍රාථමික දත්ත ද පොත්පත්, සඟරා, වාර ප්‍රකාශන , පර්යේෂණ වාර්තා මගින් ද්විතීයික දත්ත ද රැස් කරගන්නා ලදි. මෙහි දි සරල සසම්භාවී නියැදි ක්‍රමය මගින් සංචාරකයන් 50ක් තෝරා ගන්නා ලදි.

මෙම පර්යේෂණයේදී ලබා ගන්නා ලද තොරතුරු අනුව අනාවරණය වූයේ උඩරට දුම්රිය මාර්ගය සංචාරකයන් අපේක්ෂා කරනු ලබන කාර්මික පුරාවිද්‍යාත්මක හා ස්වභාවික ආකර්ෂණයන් සඳහා ප්‍රවේශය සපයන ලද බවත් දුම්රිය සේවයේ විවිධ ගැටලු දුර්වලතා පවතින නිසා තවමත් දුම්රිය සේවය සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා නොදෙන බවයි.

ප්‍රමුඛ පදඃ සංචාරක කර්මාන්තය, ප්‍රවාහනය, උඩරට දුම්රිය , සංචාරකයන්

1 සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* isharashiranida@gmail.com

2 ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* amarasekaraa@yahoo.com